**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙහි**

**නීති කෙටුම්පත් සම්පාදක සේවය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය**

**දෙවන සංශෝධනය**

<table>
<tr><th>අනු අංකය</th><th>වගන්තිය</th><th>සංශෝධනය විය යුතු ආකාරය</th></tr>
<tr><td>01</td><td></td><td>බඳවා ගැනීමේ පටිපාටියේ මාතෘකාව "නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙහි නීති කෙටුම්පත් සම්පාදක සේවය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය" ලෙස සංශෝධනය කිරීම</td></tr>
<tr><td>02</td><td>1.3</td><td>යොමු අංකය : DMS/C1/11/02 දිනය : 2011.08.01<br>DMS/1008 දිනය : 2017.09.21<br>DMS/1008 දිනය : 2019.05.03<br>DMS/1008 දිනය : 2019.11.26</td></tr>
<tr><td>03</td><td>1.5</td><td>යොමු අංකය : NSCC/10/80/2/SR දිනය : 2012.12.28<br>NSCC/01/GP/13 දිනය : 2018.01.30</td></tr>
<tr><td>04</td><td>1.6</td><td>යොමු අංකය : PSC/EST/04-01-63/03/2013 දිනය : 2013.12.12<br>පළමු සංශෝධනය : PSC/EST/04-01-63/03/2013 දිනය : 2014.12.09<br>දෙවන සංශෝධනය : PSC/EST/04-01-63/03/2013 දිනය : (රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන දිනය)</td></tr>
<tr><td>04</td><td>3.1</td><td>නීති කෙටුම්පත් සම්පාදක සේවය</td></tr>
<tr><td>05</td><td>5.1</td><td>(අ) සහකාර නීති කෙටුම්පත් සම්පාදක - LDS1 - 2016<br>(ආ) ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක - LDS2 - 2016<br>(ඇ) නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක - LDS3 - 2016</td></tr>
<tr><td>06</td><td>5.2</td><td>(අ) රු. 75,000-10X1630-91300<br>(ආ) රු. 86,500-10X2170-108200<br>(ඇ) රු.100,000-10X2350-123500</td></tr>
<tr><td>07</td><td>5.3</td><td><table>
<tr><th>තනතුර</th><th>ආරම්භක වැටුප් පියවර</th><th>ආරම්භක වැටුප් තලය (රු.)</th></tr>
<tr><td>සහකාර නීති කෙටුම්පත් සම්පාදක</td><td>පියවර 01</td><td>75,000</td></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක</td><td>පියවර 01</td><td>86,500</td></tr>
<tr><td>නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක</td><td>පියවර 01</td><td>100,000</td></tr>
</table></td></tr>
<tr><td>08</td><td>6.1</td><td><table>
<tr><th>අනුමත තනතුරු නාම</th><th>අනුමත තනතුරු සංඛ්‍යාව</th><th>කාර්යයන්</th></tr>
<tr><td>සහකාර නීති කෙටුම්පත් සම්පාදක (ඉංග්‍රීසි / දෙමළ මාධ්‍ය 05)</td><td>25</td><td rowspan="2">නීති කෙටුම්පත් භාෂාත්‍රයෙන් සකස් කිරීම, උපකාරක නීති ප්‍රතිශෝධන කිරීම, අවශ්‍ය අවස්ථාවලදී පාර්ලිමේන්තුවේ</td></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත්</td><td>08</td></tr>
</table></td></tr>
</table>

<table>
<tr><td></td><td></td><td>සම්පාදක</td><td></td><td rowspan="2">රැස්වීම්වලට සහභාගිවීම සහ පනත් කෙටුම්පත් සම්පාදනය කිරීමට අදාළ අනෙකුත් කාර්යයන්හි නිරතවීම හා අවස්ථානුකූලව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් රාජකාරියට අදාළව පවරනු ලබන කටයුතු</td></tr>
<tr><td></td><td></td><td>නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක</td><td>05</td></tr>
<tr><td>09</td><td>7.2.2.2</td><td colspan="3">නීතිඥයෙකු වශයෙන් දිවුරුම්දීමෙන් පසුව වසරක (01)ට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම</td></tr>
<tr><td>10</td><td>7.2.4 හා 7.2.4.4.1</td><td colspan="3">"ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය" යන්න "යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය" ලෙස සංශෝධනය විය යුතුය.</td></tr>
<tr><td>11</td><td>10.1</td><td colspan="3">සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරේ සිට ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරට උසස් කිරීම<br>10.1.1 සපුරාලිය යුතු සුදුසුකම්<br>i. සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරේ පත්වීම ස්ථිර කර තිබීම<br>ii. පත්කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට, සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරේ අවම වශයෙන් වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම<br>iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම<br>iv. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම<br>v. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම<br><br>10.1.2 උසස් කිරීමේ ක්‍රමය<br><br>රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සේවා පළපුරුද්ද හා කාර්යසාධන ඇගයීම් සැලකිල්ලට ගනිමින් එම මණ්ඩලයේ නිර්දේශ මත, සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව සහ පවතින පුරප්පාඩු අනුව ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.</td></tr>
</table>

| | | පරීක්ෂා කර ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| | | 1. සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරේ අවම වශයෙන් වසර 10ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයට අමතරව සේවයේ යෙදී සිටි සක්‍රිය සේවා කාලය සඳහා<br>එක් වසරකට ලකුණු 04 බැගින්<br>මාස 06ක් සඳහා ලකුණු 02 බැගින්<br>මාස 03ක් සඳහා ලකුණු 01 බැගින්<br>මාස 03කට වඩා අඩු සේවා කාලයක් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. | ලකුණු 20 | අදාළ නොවේ. |
| | | 2. වාර්ෂික කාර්යසාධනය<br>විශිෂ්ට / ඉතා හොඳයි - 03 X 05 - 15<br>සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ/<br>සාමාන්‍ය - 1.5 X 05 – 7.5<br>සතුටුදායක - 01 X 05 - 05 | ලකුණු 15 | |
| | | 3. දෙපාර්තමේන්තුවේ පොදු ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා දක්වන දායකත්වය | ලකුණු 15 | අදාළ නොවේ. |

10.2 ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරේ සිට නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක තනතුරට උසස් කිරීම

10.2.1 සපුරාලිය යුතු සුදුසුකම්

i. ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරට නියමිත වැටුප් ක්‍රමය අනුව නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක තනතුරට පත් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරෙහි වසර හත (07) ක අවම සේවා කාලයක් හා එම තනතුරෙහි වැටුප් වර්ධක හත (07) ක් උපයාගෙන තිබීම

ii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම

10.2.2 උසස් කිරීමේ ක්‍රමය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සේවා පළපුරුද්ද හා කාර්යසාධන ඇගයීම් සැලකිල්ලට ගනිමින් එම මණ්ඩලයේ නිර්දේශ මත, සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව සහ පවතින පුරප්පාඩු අනුව නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක තනතුරට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

<table>
<tr><td></td><td></td><td>
<table>
<tr><th>පරීක්ෂා කර ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>තෝරා ගැනීමට සලකා බලන අවම ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>1. ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරේ අවම වශයෙන් වසර 07ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයට අමතරව සේවයේ යෙදී සිටි සක්‍රිය සේවා කාලය සඳහා<br>එක් වසරකට ලකුණු 04 බැගින්<br>මාස 06ක් සඳහා ලකුණු 02 බැගින්<br>මාස 03ක් සඳහා ලකුණු 01 බැගින්<br>මාස 03කට වඩා අඩු සේවා කාලයක් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.</td><td>ලකුණු 20</td><td rowspan="2">අදාළ නොවේ.</td></tr>
<tr><td>2. වාර්ෂික කාර්යසාධනය<br>විශිෂ්ඨ / ඉතා හොඳයි - 03 X 05 - 15<br>සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ/<br>සාමාන්‍ය - 1.5 X 05 – 7.5<br>සතුටුදායක - 01 X 05 - 05</td><td>ලකුණු 15</td></tr>
<tr><td>3. දෙපාර්තමේන්තුවේ පොදු ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා දක්වන දායකත්වය</td><td>ලකුණු 15</td><td>අදාළ නොවේ.</td></tr>
</table>
</td></tr>
<tr><td>12</td><td>11</td><td>මෙම වගන්තිය ඉවත් කරන්න.</td></tr>
<tr><td>13</td><td>13</td><td>සක්‍රීය සේවා කාලය යනු : වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත් නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.</td></tr>
<tr><td>14</td><td>14</td><td>පළමු ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.<br>මෙම බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හා ඊට අනුෂංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති SL-05-2006 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන්ට අදාළ වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක EST/5/4/24(XIX)-9 හා 2018.02.21 අමාත්‍යාංශ ලේකම්ගේ අංක ලිපිය හා ආනුෂංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇත. SL-05-2006 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන් ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව දැනට දරන තනතුරුවලටම අන්තර්ග්‍රහණය කරනු ලැබේ.</td></tr>
</table>